ලංසු සඳහා ආරාධනයයි

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

ස්වදේශ කටයුතු අංශය

Firewall උපකරණයක් ස්ථාපනය කිරීම වෙනුවෙන් ලංසු කැඳවීම

'නිල මැදුර' පරිපාලන සංකීර්ණයේ පරිගණක ජාලය සඳහා Firewall උපකරණයක් ස්ථාපනය කිරීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය විසින් ලංසු කැඳවනු ලැබේ.

02. 2026.11.02 දින සිට 2026.11.16 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 03.00 දක්වා ආපසු නොගෙවන රු. 5,000.00 ක ගාස්තුවක් කොළඹ 05, ඇල්විටිගල මාවතෙහි පිහිටි 'නිල මැදුර' ගොඩනැගිල්ලේ, 16 වන මහලේ පිහිටි මූල්‍ය අංශයේ සරප් වෙත ගෙවා, ලබා ගන්නා වූ රිසිටිපත සමඟ "රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්" වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ප්‍රසම්පාදන ශාඛාවෙන් ලංසු ලියවිලි ලබා ගත හැක. ඉහත සඳහන් කාල සීමාව තුළ දී www.moha.gov.lk වෙබ් අඩවිය මඟින් ලංසු ලේඛන පරික්ෂා කිරීමේ අවස්ථාව සැපයුම්කරුවන් වෙත ලබා දී ඇත.

03. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු ලේඛනය '**මුල් පිටපත**' හා '**අනු පිටපත**' වශයෙන් පිටපත් දෙකකින් යුතුව වෙන වෙනම මුද්‍රා තබා ලංසු ලියවිලි බහාලන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**Firewall උපකරණයක් ස්ථාපනය කිරීම සඳහා ලංසු කැඳවීම**" යනුවෙන් සඳහන් කර 2026.11.17 දින පෙ.ව. 10.00 ට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් හෝ 16 වන මහලේ මූල්‍ය අංශයේ ප්‍රසම්පාදන ඒකකයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් ලංසු ඉදිරිපත් කළ හැක. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසු 2027.02.02 දින දක්වා වලංගු විය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් ලංසු ඉදිරිපත් කරන්නේ නම් පහත ලිපිනයට එවිය යුතු අතර ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
ස්වදේශ කටයුතු මූල්‍ය අංශය
16 වන මහල,
නිල මැදුර,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

04. 2026.11.17 දින ලංසු භාර ගැනීම අවසන් වූ පසු පෙ.ව.10.15ට 16 වන මහලෙහි පිහිටි ස්වදේශ කටයුතු මූල්‍ය අංශයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට ලංසු කරුවන්ට හෝ ඔවුන් විසින් ලිඛිතව බලය පවරන නියෝජිතයෙකුට සහභාගි විය හැක.

05. පුර්ව ලංසු රැස්වීම 2026.11.06 වන දින පෙ.ව.10.00 ට 18 වන මහලේ රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබේ.

වැඩි විස්තර සඳහා දුරකථන අංක : 011-2050412/011-2050416

ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - ස්වදේශ කටයුතු අංශය